පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 181

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින්
2025 අප්‍රේල් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2025 අප්‍රේල් මස 08 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය
කළ යුතු යැයි නියෝග කරන ලදී*

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය

2025 ජනවාරි මස 09 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(1)හි විධිවිධාන සහ 2024 දෙසැම්බර් මස 06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව, තේරීම් කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පහළොස් දෙනා පත් කරන ලදී.

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
3. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
4. ගරු කෝසල නුවන් ජයවීර මහතා, පා.ම.,
5. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
6. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
7. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
8. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
9. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
10. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
11. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
12. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
13. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
14. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
15. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,

2025 මාර්තු මස 21 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(1)හි විධිවිධාන සහ 2025 මාර්තු මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව, තේරීම් කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දොළොස් දෙනා ද පත් කරන ලදී.

1. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම.,
2. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.,
3. ගරු ඩී.වී. චානක මහතා, පා.ම.,
4. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම.,
5. ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.,
6. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම.,
7. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.,
8. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.,

9. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම.,
10. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.,
11. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම.,
12. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.,

<u>කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ❖ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - හිමාලි සමරදිවාකර මෙය
- ❖ ප්‍රධාන නිලධාරි - එච්. ආර්. ද සොයිසා මිය
- ❖ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. එල්. වික්‍රම මයා
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය

<u>කාරක සභා වාර්තා</u>

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

පටුන

		පිටු අංක
1	සභාපතිතුමාගේ සටහන	iv
2	දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව	v
3	මූල්‍යා ප්‍රකාශන පිළිබඳ විගණන මතය	1
4	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතනය- ජාතික ඖෂධ නියාමන අධිකාරිය	2
5	ඇමුණුම්	28

සභාපතිතුමාගේ සටහන

පාර්ලිමේන්තුවේ විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභා යටතේ ස්ථාපිත, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2025.03.12 හා 2025.03.26 යන දෙදින තුළ පරීක්ෂාවට ලක් කළ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2022, 2023 හා 2024 යන වර්ෂවල විගණකාධිපති වාර්තා, විශේෂ වාර්තා සහ එහි වර්තමාන කාර්යසාධනයට අදාළව සිදු කළ විමර්ශනයේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

මෙහිදී ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂභාවය සහතික කිරීම සඳහා නියාමන අධීක්ෂණ සහ සාධක පදනම් තීරණ රෝගීන්ගේ යහපත සඳහා ලබාදීම මෙහෙවර කරගත් මෙම ආයතනය ප්‍රධාන අරමුණ වූ ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන සාධාරණ මිලකට මහජනතාවට ලබා දීම කොතෙක් දුරට නිවැරදිව සිදු කළා දැයි විමර්ශනය කරන ලදී.

පසුගිය වසර කිහිපයක් පුරා විවිධ ගැටළු සමාජයට නිර්මාණය කළ මෙම ආයතනය 2015 අංක 15 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත මගින් පවරා ඇති කටයුතුවලින් බැහැරව ක්‍රියා කිරීම හේතුවෙන් නිර්මාණය වී තිබූ ගැටළු කෙරෙහි සමාජයේ දැඩි අවධානයක් යොමු වී ඇති අවස්ථාවක නීති සම්පාදනය කරන්නන් වශයෙන් පාර්ලිමේන්තුවේ අවධානය යොමු කිරීම ඉතාමත් වැදගත්ය.

මෙම වාර්තාවට ඇතුළත් කාරක සභාවේ අවධානය යොමු කළ කරුණු අතර විශේෂයෙන්ම ඖෂධවල ගුණාත්මකභාවය, ඖෂධ ආනයනය ලියාපදිංචි කිරීමේ දී වංචනික ලෙස ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම (Waiver of registration - WOR), ලියාපදිංචි කිරීමේ විශේෂ ක්‍රමවේදයක් අනුගමනය කිරීම (Special Pathway) යන කරුණු පිළිබඳව මෙම විමර්ශනයේදී වැඩි අවධානය යොමු කරන ලදී.

මීට අමතර e-NMRA ස්වයංක්‍රීය දත්ත පද්ධතිය, ගුණාත්මක බවින් තොර ඉමියුනොග්ලොබියුලින් වැනි ඖෂධ ආනයනය ආදිය කෙරෙහි ද කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමර්ශනයන් මගින් ලැබිය යුතු උපරිම සේවය රටට ලැබෙන්නේ මෙම කමිටුවේ නිර්දේශ අඛණ්ඩව, පසු විපරම් කිරීම හා වගකිව යුතු සියළු පාර්ශවයන්ගේ අවධානය ඒ කෙරෙහි යොමු වීමත්, ඒවා ක්‍රියාත්මක වීම දක්වා ගෙන ඒමත් තුළින් වේ. මෙහිදී රටේ පරමාධිපත්‍යය හිමි මහජනතාවගේ සහ ඔවුන්ගේ නියෝජිතයන් ලෙසින් මේ ගරු සභාවේ කාර්යභාරය නිසි ලෙස අඛණ්ඩව පවත්වා ගනිමින් මෙහි ඉදිරිපත් වන නිර්දේශ ක්‍රියාත්මක කර වීම දක්වා අවශ්‍ය සියළුම පියවරයන් ගැනීමට උපරිම උත්සාහය ගැනීමටත් වඩා ඵලදායී ලෙස මෙම නිර්දේශයන් යෙදවීමටත් උත්සාහ ගන්නා බව දන්වනු කැමැත්තෙමි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, එම කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහායත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්ගෙන් සහ විශේෂයෙන්ම විගණකාධිපතිතුමා ප්‍රධාන ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහායත් අගය කොට සලකමි.

වෛද්‍ය නිශාන්ත සමරවීර
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ පළමුවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම් සහ වර්තමාන කාර්යසාධනය, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය වේ.

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 457 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව)

ඒ අතරින්, 2025.03.12 වැනි දින හා 2025.03.26 වැනි දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (National Medicines Regulatory Authority –NMRA) 2022, 2023 හා 2024 යන වර්ෂවල විගණකාධිපති වාර්තා, විශේෂ විගණන වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් 2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

ආයතනය	විගණන මතය		
	2022	**2023**	**2024**
ජාතික ඖෂධ නියාමන අධිකාරිය	අහිතකර මතය	තත්ත්වාගණනය කළ මතය	විගණන මතය මෙතෙක් ලබා දී නොමැත

විගණන මත වර්ග

01 තත්ත්වාගණනය නොකළ මතය **(Unqualified Opinion)**

මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

02 තත්ත්වාගණනය කළ මතය **(Qualified Opinion)**

වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

03 මතය ව්‍යාවචනය කිරීම **(Disclaimer of Opinion)**

ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

04 අහිතකර මතය **(Adverse Opinion)**

ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

<u>ජාතික ඖෂධ නියාමන අධිකාරිය</u>

(සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය)

විමර්ශනය කරන ලද දින -2025.03.12 හා 2025.03.26

<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>

01. <u>ආයතනය සම්බන්ධ පොදු කරුණු</u>

1.1 <u>ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අරමුණු</u>

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අරමුණු අතුරින් එහි මූඛ්‍ය අරමුණ වන, **"ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීම"** යන අරමුණ වෙත කාරක සභාවේ විශේෂ අවධානය යොමු වූ අතර, ඖෂධ නියාමන අධිකාරියට පැවරී ඇති සමාජ වගකීම පිළිබඳව කාරක සභාව අවධාරණය කරන ලදී.

1.2 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය සතුව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබීම හා වසර 10 ක කාල සීමාවක් තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට දරන ලද ප්‍රයත්නයන් අසාර්ථක වීම් හෝ ප්‍රයත්න නොදැරීම සම්බන්ධයෙන් කාරක සභාවේ සාකච්ඡාවට භාජනය විය.

එහිදී ආයතනය සඳහා අභ්‍යන්තර විගණකවරයෙක් පත්කොට නොතිබුණු බව සහ වර්තමානයේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරිය, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ආයතනය තුළ ද අභ්‍යන්තර විගණක වශයෙන් වැඩ බැලීමේ පදනම මත සේවය කරමින් සිටි බවත්, මෑතක දී ආයතනය සඳහා බඳවා ගත් අභ්‍යන්තර විගණකවරිය නැවත සේවයට නොපැමිණෙන බවත් නිරීක්ෂණය විය. මින් පෙර එක් අවස්ථාවක දී පමණක් මේ සඳහා අයදුම්පත් කැඳවා ඇති බවත්, අභ්‍යන්තර විගණක තනතුර ඇතුළත් ව අනෙකුත් බොහෝ තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීමට, තනතුරු නාම නිර්ණය කිරීමට හා අනුමත කර ගැනීමට විශාල කාලයක් ගත වී ඇති බවත්, දැනට අනුමත කාර්ය මණ්ඩලය 256 ක් පමණ වුවද, වසර 3 ක කාලයක් පුරාවට ආයතනයේ තත්‍ය කාර්ය මණ්ඩලය 130 ක් පමණ වන බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.

<u>**කාරක සභාවේ නිර්දේශය**</u>

ආයතනය සඳහා අභ්‍යන්තර විගණකවරයෙක් කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කිරීම හා මේ පිළිබඳ වාර්තාවක් <u>**මාස 1 ක් ඇතුළත**</u> විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

1.3 <u>2025 ජනවාරි 26 දිනට කාර්ය මණ්ඩලය</u>

ආයතනයේ අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු වූ අතර, ඒ අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 15 ක්, තෘතිය මට්ටමේ තනතුරු පුරප්පාඩු 67 ක් ඇතුළුව 120 ක නිලධාරී හිඟයක් පවතින බවත්, තෘතිය මට්ටමේ ඖෂධ සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරින් වැඩි දෙනෙකුගේ පුරප්පාඩු පවතින බවත් ඖෂධ ඇගයීම් නිලධාරි, ඖෂධ විශ්ලේෂක වැනි තනතුරුවල උසස් වීමේ පටිපාටියේ පවතින ගැටලු හා ප්‍රාථමික සේවා ගණයේ කාර්යාල කාර්ය සහායක තනතුරු පුරප්පාඩු සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු විය.

2025 ජනවාරි 01 වැනි දින රසායනාගාරය සඳහා නිලධාරින් 15 දෙනෙක් බඳවා ගැනීම සිදු කළ අතර 2025 වර්ෂය සඳහා 65 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති බවත් ඉන් පුරප්පාඩු 55 ක් සඳහා දැනට අයදුම්පත් කැඳවා ඇති බවත්, අග්‍රාමාත්‍ය ලේකම් ප්‍රමුඛ කමිටුවේ අනුමැතියට යටත්ව දැනට බඳවා ගැනීම් සිදු කරන බවත්, සහකාර ඖෂධ ඇගයීම් නිලධාරි හා සහකාර ඖෂධ පරීක්ෂක තනතුරු 37 ක් ඇතුළු තෘතිය මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය අනුමැතිය මේ වන විට ලබා දී ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. ඖෂධ විශ්ලේෂක, සහකාර ඖෂධ විශ්ලේෂක හා ඖෂධ ඇගයීම් නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමේ දී අභ්‍යන්තර උසස් කිරීමේ ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් ආයතනය තුළ සිටින නිලධාරින් දැඩි කළකිරීමකට පත්ව ඇති බවත් ඔවුන් ආයතනය තුළ රඳවා ගැනීම අපහසුවීම පිළිබඳවත් කාරක සභාවේ අවධානය යොමු විය.

අධ්‍යක්ෂ නියාමක, අධ්‍යක්ෂ රසායනාගාර හා අධ්‍යක්ෂ මූල්‍ය යන තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටි සකස් කර සති 2 කට පමණ පෙර සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

වෙත යොමු කර ඇති බවත්, කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී නොමැති බැවින් සමහර සේවාවන් පවත්වාගෙන යාම අපහසු වී ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.

ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක් වන කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා බහු කාර්ය සංවර්ධන බලකාය මගින් බඳවා ගැනීම රජයේ ප්‍රතිපත්තිය වන අතර ඒ අනුව කටයුතු කළ යුතු බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය අවධාරණය කළද කාර්යාල කාර්ය සහායක තනතුර, බහු කාර්ය සංවර්ධන බලකායට වඩා ඉහළ තනතුරක් වන බැවින්, එමගින් බඳවා ගැනීම් සිදු කළ නොහැකි බව කාරක සභාව හමුවේ අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. ආයතනය තුළ අභ්‍යන්තර උසස්වීම් සිදුකිරීමට පවතින ගැටලු පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර නිවැරදි ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කිරීම.

ii. මේ වන තෙක් බඳවා ගැනීම් පටිපාටි (SOR) සකස් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කර අවශ්‍ය අනුමැතීන් සඳහා ඉදිරිපත් කිරීම හා මෙම කරුණු පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව **<u>මාස 1 ක්</u>** ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

iii. ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීම සම්බන්ධ ගැටලුව සමස්ථ රාජ්‍ය සේවයටම බලපාන බැවින් මේ පිළිබඳව සලකා බලා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීම සම්බන්ධව යාවත්කාලීන ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා අවශ්‍ය යෝජනා රජයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම හා මෙම කරුණු පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව **<u>මාස 1 ක් ඇතුළත කා</u>**රක සභාවට ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය - නිර්දේශ අංක (i), (ii)
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය - නිර්දේශ අංක (i), (ii)
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව - නිර්දේශ අංක (iii)

02. **<u>පනතේ විධිවිධාන ඉටු නොවීම</u>**

(අ) පනතේ 14 (ඒ) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරිය විසින් බලපත්‍ර යටතේ ආනයනය කරන ලද ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හෝ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදනවල ප්‍රමාණය පිළිබඳ දත්ත රැස් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු බව කාරක සභාවේ සාකච්ඡාවට භාජනය විය. ඖෂධ නියාමනය සිදු කිරීමට නම් රටේ ඖෂධ අවශ්‍යතාවය සහ රට තුළට ආනයනය කරනු ලබන ඖෂධ ප්‍රමාණය පිළිබඳව ජාතික ඖෂධ නියාමන අධිකාරිය දැනුවත් වී සිටිය යුතු බව කාරක සභාවේ හා විගණකාධිපතිවරයාගේ මතය විය. කාර්ය මණ්ඩල හිඟකම නිසාවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති බවත් මේ වන විට ශ්‍රී ලංකා රේගුවේ සහාය ඇතිව මෙම දත්ත රැස් කිරීම සිදු කරන බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 14 (ඒ) උප වගන්තිය ප්‍රකාරව ඖෂධ හා ඖෂධීය නිෂ්පාදනවල අවශ්‍යතාව හා ප්‍රමාණය පිළිබඳ දත්ත රැස් කිරීමට හා රට තුළ ඖෂධ පැවතීම නියාමනය කිරීමට අදාළ යෝජනා සකස් කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

(ආ) පනතේ 30(1) හා 31(1) උපවගන්ති ප්‍රකාරව ජාතික උපදේශන කමිටුව පිහිටුවා නොතිබුණු අතර ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සම්මත කර නොතිබීම හා ඖෂධ මිල නියාමනය පිළිබඳව කාරක සභාවේ සාකච්ඡාවට භාජනය විය. වර්තමාන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ජාතික උපදේශන කමිටුව හා අභියාචනා කමිටුව පිහිටුවා ඇති බවත්, 2005 වර්ෂයේ දී සකස් කරන ලද ජාතික ඖෂධ ප්‍රතිපත්තිය මේ වන විට බලාත්මක ව පවතින බවත් නිරීක්ෂණය විය. 2019 වර්ෂයේ දී ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආධාර ඇතිව කෙටුම්පතක් සකස් කළ ද එය අමාත්‍ය මණ්ඩලයට යොමු කර නොමැති බවත්, නැවත ඒ පිළිබඳව සලකා බැලීමට ජාතික උපදේශන කමිටුවේදී තීරණය වූ බවත්, ඖෂධ මිල නියාමනය සම්බන්ධයෙන් අධිකරණය විසින් අතුරු තහනම් නියෝගයක් දී ඇති බැවින් මේ වන විට ඖෂධ මිල සම්බන්ධයෙන්

මැදිහත් වීමක් සිදු කළ නොහැකි බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.

ඖෂධවල ගුණාත්මකභාවය හා මිල සම්බන්ධයෙන් ගැටලු රාශියක් පවතින බවත්, හදවත් සැත්කම් සඳහා භාවිතා කරන Papaverine hydrochloride ඖෂධය විවිධ මිල ගණන් යටතේ එනම්, 2018 වර්ෂයේ දී රු.76500, 2019 දී රු. 34000, 2020 දී රු. 35000, 2021 දී රු.41000, 2022 දී රු.72500 හා 2023 දී රු.50776 ක මුදලකට මෙරටට ආනයනය කර ඇති බවත්, මේ වන විට එම ඖෂධයම රු.370 ක මුදලකට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මිල දී ගන්නා බවත්, දැවැන්ත මූල්‍ය වංචාවක් මේ සම්බන්ධයෙන් සිදු වී ඇති බවත් මෙලෙස විශාල මුදල් නාස්තියක් වීමට ඉඩ දීම සම්බන්ධයෙන් කාරක සභාවේ අප්‍රසාදය පළ වූ අතර මෙම තත්ත්වය අවම කර ගැනීමට කලාපීය මිල ගණන් පිළිබඳ සලකා බැලීම සුදුසු බවත් කාරක සභාවේ මතය විය.

ජනතාවට අඩු මිලට ඖෂධ සැපයීම තහවුරු කිරීම ආයතනයේ වගකීම බව කාරක සභාව නිරීක්ෂණය කරන ලද අතර ඖෂධවල අවම මිල ගණන් පිළිබඳ ගැසට් පත්‍රයක් මගින් මහජනතාව දැනුවත් නොකිරීම, මෙලෙස අධිකරණය විසින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කිරීමට හේතු වී ඇති බවත් එය නිවැරදි කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු බවත් කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.

2025 මාර්තු 25 දිනට පෙර මෙම කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තුවන බවත්, එකම ඖෂධ වර්ගය සඳහා වෙළෙඳ සන්නාම 100 ක්, 200ක් වැනි ප්‍රමාණයක් පවතින බැවින් එම ඖෂධ මිල සම්බන්ධයෙන් පාරිභෝගික දැනුවත්භාවය ඇති කිරීම ඉතාම අසීරු බවත්, ඉදිරියේදී වෙළෙඳ සන්නාම ප්‍රමාණය ඉතාම අවම මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කරන බවත් කාරක සභාවේදී නිරීක්ෂණය විය.

ඖෂධ ප්‍රසම්පාදනයේ දී සන්නාම සීමා කිරීමේ දී ප්‍රසම්පාදන මූලධර්ම කඩවීමක් සිදුවිය හැකි බැවින් ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කොමිසමේ උපදෙස් ලබා ගැනීම සුදුසු බව කාරක සභාව අවධාරණය කළ අතර ඖෂධ සම්බන්ධයෙන් වෙනමම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සකස් කිරීමට ප්‍රසම්පාදන කොමිසම එකඟතාවය පළ කළ බවත්, ඖෂධවල මිල ගණන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා “Mediverify app”නමින් යෙදවුමක් සකස් කොට ඇති බවත් කාරක සභාවේදී නිරීක්ෂණය විය.

<u>**කාරක සභාවේ නිර්දේශය**</u>

ඖෂධ මිල නියාමනය කිරීම සඳහා කලාපීය මිල ගණන් පිළිබඳ සලකා බලමින් මිල සූත්‍රය නිර්මාණය කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම හා මේ පිළිබඳ වාර්තාවක් (ඖෂධ සඳහා නිර්දේශ කරන අවම මිල ගණන් සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමට අදාළ යෝජනාවන් ද ඇතුළත්ව) <u>**2025 අප්‍රේල් 12 දිනට පෙර,**</u> විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

(ඇ) පනතේ 69(1)(ආ)(v) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව නියෝජනය කිරීමේ අවශ්‍යතාවය මේ වන විට ඉටු වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළ අතර 72(1) හා 93(1) උප වගන්ති ප්‍රකාරව, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම සඳහා ඒ ඒ ඇගයීම් කමිටු වෙත පොදු මාර්ගෝපදේශ නිකුත් කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. ඊට අදාළ මාර්ගෝපදේශ සකස් කරමින් පවතින බවත්, සීමාස්ථ නිෂ්පාදන හා වෛද්‍ය උපකරණ නියාමනය කිරීම මාර්ගෝපදේශ මගින් සිදු කරන බවත්, ඊට අදාළ රෙගුලාසි ගැසට් කිරීම සිදු කර නොමැති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය

සුවඳ විලවුන් නියාමනය සම්බන්ධයෙන් ස්වෙච්ඡාවෙන් ඉල්ලීම් කරනු ලබන ආයතන සඳහා පමණක් නියාමනය සිදු කර දෙන නමුත්, සුවඳ විලවුන් නියාමනය ද ඖෂධ නියාමන අධිකාරියේ විෂය පථය යටතට ගැනීම සුදුසු බව කාරක සභාවේ දී නිරීක්ෂණය විය. ‘‘කොවිඩ් කරල’’ වැනි කිසිදු ආයතනයක් මගින් නියාමනය නොවන නිෂ්පාදන පිළිබඳ සුදුසු නියාමනයක් කළ යුතු බවත්, රූපලාවන්‍ය කටයුතු සඳහා භාවිතා කරන විශේෂයෙන්ම සම පැහැපත් වීමට යොදා ගන්නා ආලේපන වර්ග පිළිබඳවත් කාරක සභාවේ අවධානයට යොමු විය.

වෛද්‍ය උපකරණ ලියාපදිංචි කිරීම තාක්ෂණික කරුණු මත පදනම්ව ඖෂධ නියාමන අධිකාරිය විසින් සිදු කරන බවත්, ඖෂධ රසායනාගාර පවත්වාගෙන යාම හා පෞද්ගලික රෝහල් නියාමනය කිරීම, පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභා පනත අනුව සිදු කරන බවත් නිරීක්ෂණය විය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

සුවඳ විලවුන් හා පෝෂණ අතිරේක යනාදී අනෙකුත් නිෂ්පාදන ඇගයීමට අදාළ මාර්ගෝපදේශ හැකි ඉක්මණින් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම හා මේ පිළිබඳ ප්‍රගතිය විගණකාධිපතිවරයාට පිටපත් සහිතව **<u>මාස 3ක් ඇතුළත</u>** කාරක සභාවට වාර්තා කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

(ඈ) පනතේ 72(4) හා 93(4) උප වගන්ති ප්‍රකාරව වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන සඳහා අදාළ ඇගයීම් පැවැත්වීම සඳහා වූ නිශ්චිත කාලසීමා ඇතුළුව අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහන් කරමින්, යහපත් නිෂ්පාදන පරිචයන් පිළිබඳ මාර්ගෝපදේශ සහ වෙනත් අදාළ මාර්ගෝපදේශ බලාත්මක කිරීම සඳහා ද නියෝග පිළියෙල කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණ බව කාරක සභාව නිරීක්ෂණය කළ අතර මේ සඳහා මැදිහත් වන ලෙස කාරක සභාව නිර්දේශ කරන ලදි.

(ඉ) පනතේ 74 (1) හා 95(1) උප වගන්ති ප්‍රකාරව, අවසර දෙනු ලබන වෛද්‍ය උපකරණ හා ලියාපදිංචි කරන ලද සීමාස්ථ නිෂ්පාදන අමාත්‍යවරයා විසින් කලින් කළ ලැයිස්තුගත කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබීම කාරක සභාවේ අවධානයට යොමු විය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

අදාළ ගැසට් පත්‍රය නිකුත් කිරීම පිළිබඳව නැවත සලකා බලන ලෙසත්, එම ලැයිස්තු ඉක්මණින් ප්‍රසිද්ධ කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය කටයුතු කිරීමටත් කාරක සභාවේදී නිර්දේශ විය.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

(ඊ) පනතේ 83(6) හා 102(6) උප වගන්ති ප්‍රකාරව අමාත්‍යවරයා විසින්, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටු සහ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය යන ආයතන විසින් පරීක්ෂා කිරීමේ හෝ ඇගයීමේ ක්‍රියාවලියේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි, එම ක්‍රියාවලියේ කාල සීමාවන්, රැස්වීම් පැවැත්විය යුතු ආකාරය, රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි සහ ඉදිරිපත් කළ යුතු වාර්තාවල ඇතුළත් කළ යුතු කරුණු නිශ්චිතව දක්වමින් නියෝග පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු බව කාරක සභාව නිරීක්ෂණය කළ අතර අදාළ කටයුතු සම්පූර්ණ කරන ලෙසට කාරක සභාව නිර්දේශ කරන ලදි.

(උ) පනතේ 84(2), 85, 103(2) හා 104 වගන්ති ප්‍රකාරව වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ අවස්ථා මේ දක්වා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් මහජනතාව වෙත දැනුම් දී නොතිබුණු බවත්, 2019 වර්ෂය දක්වා ලියාපදිංචි කළ ඖෂධ 2019 ඔක්තෝබර් 09 දිනැති අංක 2144/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර තිබුණද, ඉන් අනතුරුව ඊට අනුකූලව කටයුතු කර නොතිබීමත් කාරක සභාවේ අවධානයට යොමු විය.

<u>**කාරක සභාවේ නිර්දේශය**</u>

ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ අවස්ථා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් මහජනතාව වෙත දැනුම් දීමට කටයුතු කිරීම සඳහා පරීක්ෂා කර බැලීම.

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

(ඌ) පනතේ 123 වගන්තිය ප්‍රකාරව, අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීම සඳහා අභියාචනා කමිටුවක් 2025 පෙබරවාරි මාසයේ දී පිහිටුවා ඇති බව කාරක සභාවේදී නිරීක්ෂණය විය.

03. ප්‍රසම්පාදන කළමනාකරණය

3.1 e- NMRA Automation පද්ධතිය

e- NMRA Automation පද්ධතිය පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු වූ අතර මේ වන විට එම දත්ත පද්ධතිය නිශ්කාර්යව පවතින බවත්, එම දත්ත පද්ධතියේ දත්ත මැකීම සම්බන්ධයෙන් අපරාධ විමර්ශන අංශයේ (CID) පරීක්ෂණයක් ක්‍රියාත්මක වන බවත්, එම දත්ත පද්ධතිය සඳහා රු.මිලියන 12 ක පමණ මුදලක් වැය කර ඇති බවත් හා එම මුදලින් කිසිදු ප්‍රයෝජනයක් ලබා ගැනීමට නොහැකි වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් කාරක සභාවේ අප්‍රසාදය පළ විය. තවද, අදාළ සමාගමේ නම Epic Lanka බව කාරක සභාවේ දී අනාවරණය විය. මෙම දත්ත පද්ධතිය භාවිතය සම්පූර්ණයෙන්ම අවසන් කර නව දත්ත පද්ධතිය සකස් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමේ වැදගත්කම කාරක සභාව පෙන්වා දුන් අතර මෙම දත්ත පද්ධතියෙන් මැකී ගොස් ඇති දත්ත සම්බන්ධයෙන් ද කාරක සභාවේ අවධානය යොමු වූ අතර, දත්ත මැකී යාම සැක සහිත බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදි.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. මෙම දත්ත පද්ධතිය සම්බන්ධයෙන් ඉදිරියේ දී ගනු ලබන ක්‍රියාමාර්ග, අදාළ ආයතනය තෝරා ගැනීමේ දී සිදු වූ ගැටලු හා මේ සඳහා වැය වූ මුදල අය කර ගැනීමට අදාළව ආයතනික වශයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේ නම් එහි දී ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව විගණකාධිපතිවරයාට පිටපත් සහිතව **<u>වාර්තාවක් මාස 01 ක් ඇතුළත</u>** කාරක සභාවට ඉදිරිපත් කිරීම.

ii. මෙම දත්ත පද්ධතියෙන් මැකී ඇති සමාගම් නාම ලේඛනය හා එකී සමාගම් විසින් ඉල්ලීම් කරන ලද ඖෂධ වර්ග පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

iii. මෙම තොරතුරු පද්ධතිය සම්බන්ධයෙන් ඩිජිටල් ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් මත කටයුතු සිදු කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

3.2 <u>ඖෂධ තොරතුරු ප්‍රතිසංස්කරණ දත්ත පද්ධතිය (Revamping the Medicine Database)</u>

ඖෂධ තොරතුරු ප්‍රතිසංස්කරණ දත්ත පද්ධතිය සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව 2020 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් වෙත ප්‍රදානය කර තිබුණ ද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ප්‍රකාරව වැඩ අවසන් කිරීම පිළිබඳ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව 2021 දෙසැම්බර් 31 දින වන විට රු.4,774,752 ක් ගෙවා තිබුණු අතර මෙම පද්ධතිය මේ වන විටත් නිෂ්කාර්යව පවතින බවත් නිසි පරිදි පරීක්ෂා කිරීමකින් තොරව සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල ගෙවීම හේතුවෙන් ආයතනයට සිදු වී ඇති මූල්‍ය අලාභය සම්බන්ධයෙන් කාරක සභාවේ දැඩි අවධානය යොමු විය.

උක්ත තොරතුරු පද්ධතිය සම්බන්ධයෙන් තාක්ෂණික කමිටුවක් පත් කර නොමැති බවත්, තොරතුරු තාක්ෂණය සම්බන්ධ සහකාර අධ්‍යක්ෂවරයෙකු විසින් මේ සම්බන්ධයෙන් කටයුතු කළ බවත් ඔහුගේ නිර්දේශය මත මෙම මුදල් ගෙවීම සිදු කර ඇති බවත්, මෙම ගෙවීම අනුමත කිරීම 2021.12.30 දින ප්‍රධාන විධායක නිලධාරිගේ අත්සනින් යුතුව සිදු කර ඇති බවත් නිරීක්ෂණය විය. අදාළ ගෙවීම නිර්දේශ කරන ලද තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂවරයා සේවයෙන් පහ කර ඇති බවත්, අදාළ සමාගමේ නම INOVA MEDICINE DATABASE SYSTEM බවත්, 2021 සැප්තැම්බර් මස සිට 2023 මැයි මාසය දක්වා රු.මි. 1.2 ක මුදලක් වරින් වර Hosting fee වශයෙන් ගෙවා ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. ඖෂධ තොරතුරු ප්‍රතිසංස්කරණ දත්ත පද්ධතිය සකස් කිරීමෙන් පසු ඒ සඳහා රු. 4,774,752 ක් ගෙවීම් සිදු කිරීමට අදාළව ආයතනික වශයෙන් අනුමැතිය ලබාදුන් නිලධාරීන් පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදුකර නිශ්චිත නිර්දේශ සහිතව **(විමර්ශන කටයුතු මාස 01 ක් ඇතුළත ආරම්භ කර<u>) මාස 2ක් ඇතුළත අතුරු වාර්තාවක්</u>** විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

ii. මෙම දත්ත පද්ධතිය සඳහා වැය වූ මුදල අයකර ගැනීමට හා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ආයතනික පරීක්ෂණයක් සිදු කිරීම.

iii. මෙම දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු නිශ්චිත නිලධාරියෙක් පත් කිරීම.

iv. ජාතික ඖෂධ නියාමන අධිකාරිය, වෛද්‍ය සැපයීම් අංශය හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව යන සියලු ආයතන ඒකාබද්ධ කරමින් ඩිජිටල් කටයුතු අමාත්‍යාංශයේ උපදේශකත්වය ලබා ගනිමින් තනි තොරතුරු පද්ධතියක් ලෙස සංවර්ධනය කිරීමේ වැදගත්කම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වූ අතර නව දත්ත පද්ධතියට අදාළ ඉදිරි කටයුතු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ඩිජිටල් ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා සම්බන්ධීකරණය කර ගනිමින් එම අමාත්‍යාංශය වෙතින් උපදෙස් ලබා ගැනීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

04. <u>2022 හා 2023 වර්ෂවල ඖෂධ අවශ්‍යතාවය, ප්‍රසම්පාදනය, සැපයුම, බෙදාහැරීම හා නියාමනය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ නිරීක්ෂණ (ඇමුණුම 01)- පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 60/2024</u>

<u>ඇමුණුම 01 පහත සබැඳිය (Link) ඔස්සේ බාගත කරගත හැකිය.</u>
http://www.auditorgeneral.gov.lk/web/images/audit-reports/upload/2024/special/Medicine_reupload/Sinhala%20Document%20with%20Cover%20Edited%202024.06.05.pdf

4.1 <u>ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම (WOR)</u>

පනතේ 58, 59, 82, 83 හා 109 වගන්ති ප්‍රකාරව යම් ඖෂධයක් හෝ වෛද්‍ය උපකරණයක් අධිකාරියේ ලියාපදිංචි නොකර හා අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකළ යුතු අතර ජීවිතයක් බේරා ගැනීමට, බෝවන රෝග හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීමට, ජාතික අවශ්‍යතාවයක් හා ජාතික ආරක්ෂාව වැනි විශේෂිත අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි (WOR) නිකුත් කිරීමට අධිකාරිය වෙත බලය ලැබී තිබුණ නමුත් එවැනි තත්ත්වයන් යටතට නොවැටෙන, ලියාපදිංචිය අවලංගු වීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම වැනි හේතු මත රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, වෛද්‍ය සැපයීම් අංශය හා පෞද්ගලික ආයතන වෙනුවෙන් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම සම්බන්ධයෙන් කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.

2019 වර්ෂයේ දී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට අදාළව මාර්ගෝපදේශ සකස් කර ඇති බවත්, 2024 දී එකී මාර්ගෝපදේශ යාවත්කාලීන කළ බවත්, එහි දී සලකා බලනු ලබන ලියකියවිලි සම්බන්ධව සඳහන් කර ඇති බව හා WOR නිකුත් කිරීමේ දී ඖෂධයේ ගුණාත්මකභාවය හා ආරක්ෂාව හැකිතාක් ආරක්ෂා කරගැනීමට එමගින් අපේක්ෂා කරන බවත් කාරක සභාවට දැනුම් දුන් අතර 2022 වර්ෂයේ දී WOR 656 ක් නිකුත් කර ඇති අතර, රටේ ඖෂධ අවශ්‍යතාව පිළිබඳ පුරෝකථනයක් කර නොමැති නිසාවෙන් මෙලෙස හදිසි තත්ත්වයක් නිර්මාණය වී ඇති බවත්, WOR භාවිතා කර තත්ත්වයෙන් අසමත් ඖෂධ රටට ආනයනය කිරීම නිසාවෙන් හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයා හා ප්‍රධාන ගණන් දීමේ නිලධාරි ඇතුළු වගකිව යුතු නිලධාරීන් බන්ධනාගාර ගත කොට මේ වන විට ඇප මත මුදා හැර සිටින බවත් කාරක සභාව ප්‍රකාශ කළාය.

මෙලෙස තත්ත්වයෙන් අසමත් ඖෂධ නිසාවෙන් සිදු වූ මරණ, අන්ධභාවයට පත්වීම් පිළිබඳව කාරක සභාවේ දී වැඩි දුරටත් සාකච්ඡා වූ අතර එහිදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය තම වගකීම්වලින් බැහැරව කටයුතු කිරීම සම්බන්ධයෙන් අප්‍රසාදය පළ කරන ලදී.

ඇතැම් ආයතන ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලබා ගෙන ඖෂධ ප්‍රසම්පාදන කටයුතු සඳහා සම්බන්ධ නොවන බවත්, වසර 02 ක කාලයක් තුළ ඖෂධ ගෙන්වීම සිදු නොකරන හෝ ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහභාගි නොවන ආයතනවල ලියාපදිංචිය අහෝසි කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට බලය ඇති බවත්, හදිසි විශේෂ අවශ්‍යතාවන් පදනම් කර ගනිමින් WOR මගින් ඖෂධ ගෙන්වීමට ලබා දෙන අවසරය යොදා ගනිමින් රට තුළ ඖෂධ මාෆියාවක් සිදු වෙමින් පවතින බවත් එහි දී ජාතික ඖෂධ නියාමන අධිකාරිය තම වගකීමෙන් බැහැරව කටයුතු කර ඇති බව පෙනී යන බවත් කාරක සභාව ප්‍රකාශ කරන ලදි.

රට තුළ ඖෂධ හිඟවන තෙක් ඖෂධ අවශ්‍යතාවය හඳුනා නොගැනීම අඩුපාඩුවක් බවත්, එම වරද සිදුවන්නේ කුමන ස්ථානයකින්ද යන්න පිළිදව කාරක සභාවේ අවධානයට යොමු වූ අතර අද වන විට ඖෂධ වර්ග 862 කින් 170 ක් පමණ හිඟ බවත්, NMRA ලියාපදිංචි සහතික ඇති සැපයුම්කරුවන් ප්‍රසම්පාදන කටයුතු සඳහා සහභාගි නොවීම මත වෛද්‍ය සැපයීම් අංශය විසින් WOR නිකුත් කරදෙන මෙන් NMRA වෙත ඉල්ලීම් කරන බවත්, මේ වන විට ශ්‍රී ලංකාවේ රජයේ

රෝහල් තුළ Salbutamol nebuliser solutions ඖෂධය මාස 03 ක් තිස්සේ නොමැති බව හා මේ සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් දෙදෙනාම මෙම ඖෂධය ප්‍රසම්පාදන කටයුත්තට සහභාගි නොවන බවත් කාරක සභාවේදී අනාවරණය විය.

මෙලෙස රාජ්‍ය අංශයට ඖෂධ සැපයීම් සිදු නොකර පෞද්ගලික අංශයට පමණක් ඖෂධ සැපයීම සිදු කරන ලියාපදිංචි සැපයුම්කරුවන්ට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළ අතර, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ අංක 65 (1) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචිය සහ බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම සිදු කළ හැකි අවස්ථා සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු විය. එහිදී **"රාජ්‍ය හා පෞද්ගලික අංශය යන දෙකටම ඖෂධ සැපයීම කළ යුතු බවත් එලෙස නොකරන්නේ නම් ලියාපදිංචිය සහ බලපත්‍රය අවලංගු කරන බවට"** කොන්දේසි පනවා නොමැතිවීම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වරදක් බව කාරක සභාව අවධාරණය කරන ලදි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මගින් සෘජුව ඖෂධ ආනයනය කිරීමට හැකි වන පරිදි පනත සංශෝධනය කිරීම සුදුසු බවද කාරක සභාවේ මතය විය.

WOR නිකුත් කිරීමේ දී සලකා බලන කරුණු පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළ අතර, WOR ක්‍රමවේදය හරහා 2020 දෙසැම්බර් 24 දින අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි විසින් පෞද්ගලික සමාගමක් වෙත නිකුත් කර තිබුණු ලිපියක් මගින් හෘද, අක්මා , වකුගඩු රෝග හා අධිරුධිර පීඩන වැනි රෝගී තත්ත්වයන්වල දී භාවිතා කරන පිරිවැය රු. 2,563,080/- ක් වූ Furosemide syrup ඖෂධ තොගය රෝහල් වෙත බෙදා හැරීමෙන් අනතුරුව තත්ත්වයෙන් අසමත්වීම හේතුවෙන් 2021 ඔක්තෝබර් 08 දින සමස්ථ ඖෂධ තොගයම භාවිතයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම සම්බන්ධව කරුණු විමසන ලදී. එමෙන්ම එලෙස ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි යටතේ වෛද්‍ය සැපයීම් අංශය විසින් මිල දී ගන්නා ලද Bupavacaine ඖෂධය භාවිතා කිරීමෙන් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ දී කාන්තාවක් මිය ගොස් තවත් කාන්තාවකට බරපතල අහිතකර ප්‍රතික්‍රියා ඇති වීම සම්බන්ධව ද කාරක සභාවේ අවධානය යොමු විය.

මෙලෙස WOR කමිටුවේ අනුමැතියට යටත්ව, තත්ත්වයෙන් අසමත් ඖෂධ ආනයනය කරන ලද ආයතනය සම්බන්ධයෙන්

ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව කරුණු විමසන ලද අතර ආයතනය අසාධු ලේඛනගත කිරීමක් සිදු නොවන බව අනාවරණය විය. එසේම ඖෂධ ආනයනය කිරීමෙන් පසු, එම ඖෂධ බෙදාහැරීමට පෙර ඒවායේ ගුණත්වය පරීක්ෂා කිරීම සිදු නොකරන බවත්, ඒ සඳහා රසායනාගාර පහසුකම් නොමැති බවත් කාරක සභාවේදී අනාවරණය විය.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතුව පවතින රසායනාගාරයේ ධාරිතාවය වැඩි කර ගැනීමට තවමත් නොහැකි වී ඇති බවත්, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා සමග රසායනාගාරයේ ඉදිකිරීම් පිළිබඳව සාකච්ඡා කළ බව හා ITI ආයතනය මෙම කටයුත්ත සඳහා කැමැත්ත පළ කළ බවත්, SLINTEC ආයතනය සමග රසායනාගාරය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් එහිදී නිරීක්ෂණය විය. ආයතනය සතුව රු.බි. 07 ක මුදල් සංචිතයක් සතුව පවතින බවත්, ආයතනයේ අරමුදල් යොදා ගනිමින් රසායනාගාරයක් ඉදිකිරීමට ඇති හැකියාව පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. NMRA හි ලියාපදිංචි වී ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී රාජ්‍ය අංශයට ඖෂධ සැපයීම සිදු නොකරන එනම් පෞද්ගලික අංශයට පමණක් ඖෂධ සපයන ලියාපදිංචි සැපයුම්කරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි වන පරිදි පනත /රෙගුලාසි සංශෝධනය කිරීම.

ii. WOR නිකුත් කිරීමට ඇති ප්‍රතිපාදන යොදා ගනිමින් සිදු කරන ඖෂධ මාෆියාව පාලනය කිරීමට පනත සංශෝධනය කරමින් අවශ්‍ය මැදිහත්වීම සිදු කිරීම.

iii. තත්ත්වයෙන් බාල ඖෂධ සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම හා එවැනි තත්ත්වයෙන් බාල ඖෂධ ගෙන්වන ලියාපදිංචි සැපයුම්කරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට හා එකී සැපයුම්කරුවන් අසාධු ලේඛනගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

iv. ආයතනයේ අරමුදල් භාවිතා කොට මෙරටට ගෙන්වන සියලුම ඖෂධ පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් ඉදිකිරීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීම.

v. ඉහත කරුණු පිළිබඳව ගන්නා ලද ක්‍රියාමාර්ග ඇතුළත් කර විගණකාධිපතිවරයාට පිටපත් සහිතව වාර්තාවක් **<u>මාස 01 ක් ඇතුළත</u>** කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

4.2 Special pathway ක්‍රමය භාවිතා කර ගුණත්වය පරීක්ෂා කිරීමකින් තොරව ඖෂධ මෙරටට ගෙන්වීම

(අ) 2022 සැප්තැම්බර් 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව අනුකම්පු අනුමැතිය සඳහා යොමු කිරීමෙන් තොරව Special Pathway ක්‍රමය වශයෙන් හඳුන්වනු ලබන වේගවත් යාන්ත්‍රණයක් (fast track) හරහා ප්‍රධාන විධායක නිලධාරිගේ අනුමැතිය මත ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබීම සම්බන්ධයෙන් කාරක සභාවේ විශේෂ අවධානය යොමු වූ අතර, මෙම ක්‍රමවේදයේ දී ඖෂධය සම්බන්ධ තාක්ෂණික කරුණුවලට අදාළ Certificate of Analysis (COA), Certificate of Pharmaceutical Product (COPP), Stability report සහ GMP Report යනා දී කිසිදු තාක්ෂණික ලියවිල්ලක් පිළිබඳව සලකා බැලීමක් සිදු කර නොමැති බව කාරක සභාවේදී අනාවරණය විය.

WOR අනුකම්පු අනුමැතියකින් තොරව මෙම special pathway ක්‍රමය හරහා ඖෂධ ආනයනය කිරීම පිළිබඳ යෝජනාව හිටපු ප්‍රධාන විධායක නිලධාරී වෛද්‍ය විජිත් ගුණසේකර මහතා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනා කළ බවත්, මෙම special pathway ක්‍රමය හරහා ඖෂධ ආනයනය කටයුත්ත සිදුවන කාල වකවානුවේදී අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කළ නිලධාරින් පිළිබඳ කාරක සභාව විසින් විමසන ලදුව, ළමා රෝග විශේෂඥ වෛද්‍ය කෝසල කරුණාරත්න මහතා සහ වෛද්‍ය ප්‍රදීප් කුමාරසිංහ ද සිල්වා මහතා එම කාල සීමාවේ දී අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කළ බවත්, එම නිලධාරින් දෙදෙනා මෙම Special pathway ක්‍රමයට විරෝධතාවය දක්වා ලිපි ඉදිරිපත් කළ බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එවක සිටි අධ්‍යක්ෂ මණ්ඩලයේ විනිවිදභාවය පිළිබඳව තමන්ට විශ්වාසයක් නොතිබූ බැවින්, කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට තමන් සහභාගි නොවූ බවත්, මෙම Special pathway ක්‍රමවේදය තමන් අනුමත නොකරන බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගොනු සටහනක් (minute) යොදා ඇති බවත් කාරක සභාවේදී අනාවරණය වූ අතර Savorite නමැති සමාගමෙන් ගෙන්වන ලද ඖෂධවල, අත්‍යාවශ්‍ය නොවන (Non essential) ඖෂධ අඩංගු වන බැවින් ඊට විරෝධය දක්වමින් ළමා රෝග විද්‍යායතනය (College of Pediatricians) හා කායික රෝග විද්‍යායතනය (College of Physicians) යන දෙකෙන්ම විරෝධතා ලිපි නිකුත් කළ බව වෛද්‍ය කෝසල කරුණාරත්න මහතා විසින් අනාවරණය කරන ලදි.

මෙම special pathway ක්‍රමය සම්බන්ධව කටයුතු කිරීමේ දී ජාතික ඖෂධ නියාමන අධිකාරිය කෙරෙහි අමාත්‍යාංශ ලේකම්ගෙන් සිදුවූ බලපෑම සම්බන්ධව කාරක සභාවේ දී අවධානය යොමු වූ අතර සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන ක්‍රමවේදයෙන් බැහැරව, 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී කොළඹ නගරයේ ප්‍රධාන පෙළේ හෝටලයක පවත්වන ලද රාත්‍රී භෝජන සංග්‍රහයකට සමගාමීව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් හරහා අවසන් මොහොතේ ඖෂධ වර්ග විශාල ලැයිස්තුවක් WOR සඳහා අනුමැතියට ඉදිරිපත් කළ බවත්, මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව පවසමින් සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා නොදුන් බව, තමන් මෙම කටයුත්තට විරෝධතාවය දක්වමින් මහාචාර්ය එස්. ඩී. ජයරත්න මහතාට ලිපියකින් දැනුම් දුන් බව, වෛද්‍ය කෝසල කරුණාරත්න මහතා මෙම සාකච්ඡාවට zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වූ බව හා වර්ෂාපතන තත්ත්වය නිසා එතුමාගේ සම්බන්ධතාවය වරින්වර බිඳවැටුණු බව හා මෙම රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා වූ වියදම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පෞද්ගලිකව දරන ලද බවත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික වෛද්‍ය ප්‍රදීප් කුමාරසිංහ ද සිල්වා මහතා කාරක සභාව හමුවේ අනාවරණය කරන ලදි.

මෙම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ලබා ගත් රු. 100,000/- ක අත්තිකාරම් මුදල නැවත ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ගිණුමෙහි තැන්පත් කර තිබු බවත්, මෙම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට ගෙවන දීමනාව ගෙවා නොමැති බවත්, මෙදින පවත්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වලංගුභාවය ගැටලු සහගත බවත් එම රැස්වීමේ ගණපූරණය පවත්වා ගත්තේ ද යන්න පිළිබඳව සොයා බැලිය යුතු බවත් කාරක සභාවේ අවධානයට යොමු විය.

උක්ත ප්‍රශ්නගත කාල සීමාව තුළ NMRA ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ ඖෂධවේදී විද්‍යායතනය (College of Pharmacologists) නියෝජනය කරමින් කිසිදු වෘත්තිකයෙක් නම් කර නොතිබූ නමුත් ඖෂධවේදී විද්‍යායතනය නියෝජනය කරමින් මහාචාර්ය ප්‍රියදර්ශනී ගලප්පත්ති මහත්මිය එම කාල සීමාවේ දී ඖෂධ ඇගයීම් කමිටුවේ (Medicines Evaluation Committee- MEC) සාමාජිකයෙක් ලෙස කටයුතු කළ බව නිරීක්ෂණය වූ අතර ඖෂධ වර්ග 300 ක පමණ ලැයිස්තුවකට WOR නිකුත් කිරීම සඳහා ඖෂධ ඇගයීම් කමිටුවට යොමු වූ බවත්, එම ඖෂධ කිසිවක් WOR කමිටුවෙන් අනුමත කර නොතිබූ බැවින් ඒ සඳහා ඖෂධ ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා දී නොමැති බවත්, මෙලෙස අනාරක්ෂිත ඖෂධ රට තුළට ගෙන්වන මෙම ක්‍රමවේදය නවත්වන ලෙස දැනුම් දෙමින්

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා වෙත ද ලිපි යොමු කළ බව හා එම කිසිදු ලිපියකට ප්‍රතිචාර නොලද බවත්, අසාධු ලේඛනගත කරන ලද සමාගම් ද උක්ත ලැයිස්තුවේ ඇතුළත්ව තිබූ බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.

මෙම ප්‍රශ්නගත ඖෂධ ආනයන ක්‍රියාවලිය සිදුවන කාලසීමාවේ දී ඖෂධ නියාමන අධිකාරියේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි ලෙස මහාචාර්ය එස්.ඩී. ජයරත්න මහතා සහ වෛද්‍ය විජිත් ගුණසේකර මහතා සහ විෂයභාර අමාත්‍යවරයා ලෙස කෙහෙලිය රඹුක්වැල්ල මහතා කටයුතු කළ බවත්, මෙම special pathway ක්‍රමය හරහා ඖෂධ ගෙන්වීමට අදාළ ක්‍රියාවලිය ආරම්භ වී ඇත්තේ වෛද්‍ය විජිත් ගුණසේකර විසින් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වෙත යොමු කරන ලද ලිපියකින් බවත් අනාවරණය වූ අතර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද ඖෂධ ලැයිස්තුව තුළ අත්‍යාවශ්‍ය නොවන ඖෂධ හා ආලේපන වර්ග අඩංගු වී තිබුණු බවද කාරක සභාවේදී අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. මෙම ගැටලුව පිළිබඳ කරුණු විමසීම සඳහා ආයතනයේ හිටපු ප්‍රධාන විධායක නිලධාරි හා හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් කාරක සභාව හමුවට කැඳවීම. (එම නිලධාරීන් 2025.03.26 වැනි දින කාරක සභාව හමුවට කැඳවා කරුණු විමසන ලදී)

ii. WOR නිකුත් කිරීම සම්බන්ධයෙන් වන සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව විශේෂ ක්‍රමවේදයක් හරහා ඖෂධ ආනයනයට අවසර දීම හේතුවෙන් තත්ත්වයෙන් අසමත් ඖෂධ රට තුළට පැමිණීම නිසා සිදු වූ හානියට මුල් වූ නිලධාරීන් හා ඊට මුල් වූ කරුණු පිළිබඳව ද තොරතුරු ඇතුළත් කරමින් විස්තරාත්මක වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව **<u>මාස 01 ක් ඇතුළත</u>** කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

(ආ) 2022 දෙසැම්බර් මාසයේ දී අධිකාරිය විසින් අනායාචිත යෝජනා හරහා ඉදිරිපත් වූ ඖෂධ අයිතම 38 ක් ආනයනය කිරීම සඳහා Savorite නමැති සමාගමක් වෙත ලියාපදිංචිය නිදහස් කිරීමේ

සහතික 38 ක් නිකුත් කර තිබුණු නමුත් ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් අදාළ ඖෂධ ඇගයීම් සිදු කර නොමැති බවත්, ඒ හේතුවෙන් අදාළ ඖෂධවල ගුණාත්මය, ආරක්ෂාකාරීබව හා ප්‍රත්‍යක්ෂබව (quality, safety, efficacy) පිළිබඳ අධිකාරිය වග නොකියන බවටත් වගකීම වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ විසින් භාරගත යුතු බවටත් කොන්දේසි ඉදිරිපත් කරමින් එහි වගකීම අධිකාරිය විසින් අත්හැර තිබීම සම්බන්ධයෙන් කාරක සභාවේ දැඩි අවධානය යොමු විය

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. අදාළ ආයතනයේ දේශීය නියෝජිතයා පිළිබඳ තොරතුරු විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

ii. ඖෂධ 323 ක් ගෙන්වීම මගින් සිදු වූ සමස්ථ හානිය පිළිබඳ විමර්ශනයක් සිදු කර වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව **<u>මාස 01 ක් ඇතුළත</u>** කාරක සභාවට ඉදිරිපත් කිරීම.

iii. පනතේ දුර්වලතාවයන් මගහරවා ගැනීමට අදාළ කරුණු සලකා බැලීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ඖෂධ නියාමන අධිකාරිය

(ඇ) මෙලෙස අනායාචිත ක්‍රමවේද යටතේ ගුණාත්මයෙන් අසමත් ඖෂධ වර්ග මෙරටට ආනයනය කර ඇති අතර Human immunoglobulin වැනි ඖෂධ මෙරටට ගෙන්වීම නිසා වූ ජීවිත හානිය පිළිබඳව ගණනය කිරීමක් සිදු කර නොමැති වීම සහ ඇස් අන්ධ වීමට අදාළ Prednisolone ඖෂධය ලංකාවට ආනයනය කරන ලද සමාගම මෙතෙක් අසාධු ලේඛනගත කර නොමැති වීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වූ අතර එයට කාරක සභාවේ දැඩි අප්‍රසාදය පළ විය. ඇස් අන්ධවීමට අදාළ ඖෂධය ආනයනය කරන ලද දේශීය නියෝජිත ආයතනය "Chami Chemist" බව කාරක සභාව හමුවේ අනාවරණය වූ අතර නියාමන අධිකාරියක් ලෙස පනතින් පවරා ඇති බලතල තම ආයතනය යටතට ගත යුතු බවත් මිනිස් ජීවිතවලට දැඩිව බලපාන ඖෂධ නියාමනය පිළිබඳ කාර්යය අවභාවිතා කිරීමට ඉඩ නොතැබිය යුතු බවත් කාරක සභාව අවධාරණය කළාය.

05. **<u>ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීමට අනුකමිටුවක් පත් කිරීම</u>**

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වුවහොත් මන්ත්‍රීවරුන් තිදෙනෙකුගෙන් යුත් අනුකමිටුවක් පත් කිරීමට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

06. **<u>ඖෂධ හා උපකරණ ආනයනය කිරීම</u>**

2025.03.26 දින රැස්වූ කාරක සභාවේදී ඖෂධ හා උපකරණ මෙරටට ආනයනය කිරීම සම්බන්ධයෙන් ඖෂධ හා උපකරණ ලියාපදිංචිය හා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික (**Waiver of Registration- WOR)** නිකුත් කිරීම යන ප්‍රධාන කරුණු පිළිබඳව අවධානය යොමු වූ අතර ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම සිදු කළ හැකි අවස්ථා පිළිබඳව 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 109 වගන්තිය මගින් ලබා දී ඇති ප්‍රතිපාදන පිළිබඳව කාරක සභාවේදී සාකච්ඡා කරන ලදි.

2022.10.25 දිනැතිව **"ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩ වෛද්‍ය සැපයීම් සේවාවක් පවත්වා ගෙන යාම"** මාතෘකාව යටතේ හිටපු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා විසින් අත්සන් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් (ඇමුණුම 02) මගින් "වෛද්‍ය සැපයුම් අංශය තුළ වෛද්‍ය සැපයුම්වල දැනට පවතින තොග අවදානම් මට්ටමක පවතින බවත් 2022.10.17 වන විට වෛද්‍ය සැපයුම් අංශයේ ඖෂධ 151 ක ශල්‍ය වෛද්‍ය උපකරණ හා පරිභෝජ්‍ය භාණ්ඩ 5278 ක, විකිරණශීලී උපකරණ 18 ක සහ නිත්‍ය සහ අනුපූරක රසායනාගාර උපකරණ 850 ක තොග ශුන්‍ය මට්ටමක පවතින බවත්, ඉදිරි සති 3 ක කාල සීමාව තුළ තව බොහෝ උපකරණවල තොග අවසන් වන බවට අපේක්ෂා කරන බවට දක්වා තිබීම පිළිබඳව කාරක සභාවේ දැඩි අවධානය යොමු විය. එහිදී තවත් ඖෂධ 21 ක සහ ශල්‍ය වෛද්‍ය උපකරණ හා භාණ්ඩ 2002 ක, රෝහල් තුළ (ආයතනික මට්ටමේ) තොග මට්ටම් දැනටත් ශුන්‍යව පවතින අතර මේ හේතුව නිසා ඉදිරි කාල සීමාව තුළ රටේ සෞඛ්‍ය ආයතන තුළ උග්‍ර වෛද්‍ය සැපයුම් හිඟයක් නිර්මාණය වීමේ දැඩි අවදානමක් පවතින බවටත් මැහුම් අමුද්‍රව්‍ය, නිර්වින්දන ඖෂධ වැනි ශල්‍යකර්ම සඳහා අත්‍යාවශ්‍ය තොග ඉතා අවම මට්ටමක් පැවතීම නිසා ඉදිරි සති 3 ක කාල සීමාව තුළ ශල්‍යාගාරවල ක්‍රියාකාරීත්වය මුළුමනින්ම අක්‍රීය කරනු ඇතියි අපේක්ෂා කෙරෙන බවටත්, සම්පූර්ණ සෞඛ්‍ය පද්ධතියම ඉදිරි සති 3ක කාලය තුළ තොග අවසන් වීමෙන්

සම්පූර්ණයෙන්ම බිඳ වැටිය හැකි බවටත් මෙමගින් පෙන්වා දීමට උත්සාහ කර ඇති බවත් කාරක සභාවේ සභාපති ප්‍රකාශ කළේය.

ඉන්දියානු ණය යෝජනා ක්‍රමය හා අනෙකුත් අරමුදල් භාවිතා කොට **දින 45 ක් ඇතුළත ශ්‍රී ලංකාව වෙත මාස 3 ක කාලයක් සඳහා** ප්‍රමාණවත් වන වෛද්‍ය සැපයුම් තොග ලබා දිම සඳහා **The Savorite Pharmaceuticals (Pvt) Ltd.** (703, **Atlantis Heights, Sarabhai Compound, Vadiwadi Road, Vadodara- 39007 Gujarat, India)** ආයතනය එකඟතාව පළ කොට ඇති බවත්, 2022. 10.25 වන දින වන විට මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇති බවත් කාරක සභාවේදී නිරීක්ෂණය විය.

ඉන්දියානු ණය යෝජනා ක්‍රමය මගින් ලබා දුන් අරමුදල් සම්පූර්ණයෙන්ම භාවිතයට ගන්නා ලෙස මීට වසර දෙකකට පමණ පෙර පැවති කාරක සභා රැස්වීමක දී ලබා දෙන ලද නියෝග ක්‍රියාත්මක කර නොමැති බවද කාරක සභාවේදී අනාවරණය වූ අතර ඉහතින් සඳහන් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කර ඇති පරිදි රට තුළ ඖෂධ හිඟයක් පැවතියා ද යන කරුණ යථාර්ථවාදී ද යන්න හා එලෙස රට තුළ ඖෂධ හිඟයක් ඇතිවන තෙක් මෙම ආයතන ක්‍රියාත්මක නොවීම පිළිබඳවත් මෙලෙස අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් එක් නිශ්චිත ආයතනයක් නම් කර තිබීම ගැටලු සහගත බවත් කාරක සභාව අවධාරණය කරන ලදි. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයේ තොග ශූන්‍ය ලෙස සඳහන් කර ඇති ඖෂධ වර්ග, මෙම ඇණවුම ඉදිරිපත් කර සති තුනක පමණ කාල සීමාවක් තුළ විශාල තොගයක් ලැබී ඇති බව නිරීක්ෂණය වූ බවත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව තුළ ලැබිය යුතු ඖෂධ තොග සම්බන්ධයෙන් සඳහන් නොවන බවත් අමාත්‍ය මණ්ඩලයට ඖෂධ තොග සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු සැපයුවේ ද යන්න ගැටලු සහගත බවත්, 2023 සැප්තැම්බර් මස වන විට ඖෂධ වෙනුවෙන් ලද එ.ජ.ඩොලර් මි. 360 න් එ.ජ. ඩොලර් මි.160 ක් භාණ්ඩාගාරයට ආපසු යැවීම පිළිබඳවත් කාරක සභාවේ අවධානය යොමු විය.

මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කිරීමට අදාළ තොරතුරු ලබා දුන්නේ කවුරුන්ද, අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කළේ කවුරුන් ද, ඒ සඳහා අනුමැතිය ලබා දුන්නේ කවුරුන්ද යන්න පිළිබඳව කාරක සභාවේ දැඩි අවධානය යොමු වූ අතර වෛද්‍ය සැපයීම් අංශය මගින් ලබා දෙන තොරතුරු මත පදනම් ව ඖෂධ නියාමන අංශය වෙත ඉදිරිපත් කරන තොරතුරු අනුව

අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා විසින් සකස් කර, අමාත්‍යාංශ ලේකම්වරයා හරහා අමාත්‍ය මණ්ඩල සංදේශය, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බවත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කරන ලෙසට අමාත්‍යාංශ ලේකම්වරයා විසින් උපදෙස් ලබා දුන් බවත් අනාවරණය විය. නමුත් දත්ත පද්ධතියෙන් ලබා ගත් දත්ත තුළ ලැබිය යුතු ඇණවුම් පිළිබඳ සඳහනක් තිබුණාද යන්න හා ඒවා සලකා බැලුවේ ද යන්න පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. 2022.09.22 දිනැතිව වෛද්‍ය ආර්.එම්. එස්.කේ රත්නායක මහතා විසින් වෛද්‍ය ඩී. ආර්.කේ හේරත් මහතා (වෛද්‍ය සැපයුම් අංශය) වෙත යොමු කරන ලද ලිපියක් උපුටා දක්වමින් කලින් ඇණවුම් කර, ලැබීමට ඇති තොග පිළිබඳව සලකා බැලීමක් සිදු කර නොමැති බව කාරක සභාවේදී අවධාරණය කරන ලදි.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>

i. මෙකී අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කරන මොහොත වන විට රට තුළ දැවැන්ත ඖෂධ හිඟයක් පැවති බවටත් එය වෛද්‍ය සැපයීම් අංශයේ දත්ත පද්ධතිය තුළ ඇතුළත්ව තිබූ බවටත්, එය තහවුරු කිරීමට අදාළ ලේඛන **<u>මාස 1 ක් ඇතුළත</u>** කාරක සභාවට ඉදිරිපත් කිරීම.

ii. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කිරීමට අදාළ තොරතුරු ලබා දුන් නිලධාරියා, අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කළ නිලධාරියා යන කරුණු ද ඇතුළත්ව අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට අදාළ තොරතුරු ඇතුළත් වාර්තාවක් **<u>මාස 1 ක් ඇතුළත</u>** කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්- වෛද්‍ය සැපයීම් අංශය

07. <u>Savorite Pharmaceuticals ආයතනය හරහා අත්‍යවශ්‍ය ඖෂධ ආනයනය කිරීම</u>

2022.11.30 වැනි දින ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති අමතමින්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශයේ එවක අධ්‍යක්ෂ වෛද්‍ය ඒ. ටී. සුදර්ශන මහතා ගේ අත්සනින් යොමු කරන ලද ලිපියකට අනුව මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මත පදනම්ව අදාළ ආයතනයෙන් ඖෂධ වර්ග 38 ක් ගෙන්වීම සඳහා අවශ්‍ය කටයුතු කරන මෙන් ඉල්ලා ඇති බව කාරක සභාවේදී අනාවරණය විය.

ඒ අනුව Savorite Pharmaceuticals ආයතනය අධිකාරියේ ලියාපදිංචි නොවූවද, මෙම ඖෂධ අත්‍යවශ්‍ය වන බැවින්, Savorite Pharmaceuticals ආයතනයෙන් මෙම ඖෂධ හැකි ඉක්මනින් ආනයනය සඳහා WOR නිකුත් කරන ලෙස උක්ත ලිපියෙන් දන්වා ඇති බවත් කාරක සභාවේ අවධානයට යොමු විය. එසේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම්, ජනක චන්ද්‍රගුප්ත මහතාගේ අත්සනින්, 2022.12.13 වන දින, ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වෙත යොමු කරන ලද ලිපියට අනුව, ශ්‍රී ලංකාවේ හදිසි දරුණු ඖෂධ හිඟයක් මග හරවා ගැනීම සඳහා මෙසේ Savorite Pharmaceuticals ආයතනය සඳහා WOR ලබා දෙන ලෙස ඉල්ලා සිටින බවත්, අමාත්‍ය මණ්ඩලය මේ සඳහා අනුමතිය ලබා දී ඇති බැවින් ලිපියට අමුණා ඇති අත්‍යාවශ්‍ය ඖෂධ, මාස 03ක් සඳහා උක්ත ආයතනයෙන් ආනයනය කරන ලෙසත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය මෙම ඖෂධ ආනයනය සඳහා ඍජු ආනයනකරු වන බවත්, රටෙහි වර්තමාන ආර්ථික අර්බුදය හා ඖෂධ හිඟතාවය සලකා බලා මෙම WOR නොමිලේ නිකුත් කරන ලෙස සඳහන් බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

ඖෂධ නියාමන අධිකාරිය විසින් 2022.09.16 දින විශේෂ ක්‍රමවේදය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලෙස ඉන්දියානු ණය ආධාර (Indian Credit Line), ආසියානු සංවර්ධන බැංකුව (ADB), ලෝක බැංකුව (WB) සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් (Asian Infrastructure Investment Bank) ප්‍රසම්පාදන සඳහා WOR නිකුත් කිරීම සඳහා වේගවත් යාන්ත්‍රණයක් (Fast track) සඳහා අනුමත විශේෂ ක්‍රමවේදය පිළිබඳ දැනුම්දීම යන මාතෘකාව යටතේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් නිකුත් කිරීම පිළිබඳ නිරීක්ෂණය කළ කාරක සභාව එහි සඳහන් පහත කරුණු පිළිබඳ දැඩි අවධානය යොමු කරන ලදී. එහිදී 2022.09.16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සඳහන් දැනුම් දීම් (Note to board) අමාත්‍ය මණ්ඩලය විසින් ඒ වන විටත් අනුමත කර ඇති ක්‍රියා පටිපාටිය පිළිබඳව, අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනගැනීම සඳහා පමණක් ඉදිරිපත් කරන්නක් බවත්, මෙය නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අවස්ථාව වන විටත් මෙසේ WOR නිකුත් කිරීම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී වෛද්‍ය විජිත් ගුණසේකර මහතා විසින් ආරම්භ කොට තිබූ බවත්, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගෙන හෝ ඒ පිළිබඳ සාකච්ඡා කර හෝ නොතිබූ බවත්, මෙම Savorite

Pharmaceuticals ආයතනය සඳහා ඒ වන විටත් WOR නිකුත් කර 2022 දෙසැම්බර් 29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට වාර්තා කර ඇති බවත්, අනුමැතිය ලබා දීමෙන් පසු මෙම ලේඛන ලැබුණු බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය මේ සඳහා වග නොකියන බවට ප්‍රකාශ කළ **(endorse)** බවත්**,** අනාවරණය විය.

එසේම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ පිළිබඳව MEC කමිටුවට ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කර ඇති බවත්, ප්‍රධාන විධායක නිලධාරීගේ නිර්දේශ සමග MEC නිර්දේශ නොගැලපෙන බැවින් 2023.02.17 දිනැතිව, ඉතිරි ඖෂධ 89 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර තිබූ බවත්**,** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙය වෛද්‍ය සැපයීම් අංශයට හා සෞඛ්‍ය අමාත්‍යාංශයට දන්වන ලෙස දැනුම් දී ඇති බවත්**,** එනමුත්, වෛද්‍ය සැපයීම් අංශයේ නිලධාරීන් ඒ වන විට බෙහෙත් භාර ගෙන ඒ සඳහා අනුමැතිය ලබා දී තිබූ බවත් නිරීක්ෂණය විය. පනතට අනුව රටට ගෙන්වන ඖෂධවල ආරක්ෂාව, ප්‍රත්‍යක්ෂභාවය හා ගුණාත්මකභාවය පවත්වාගෙන යාම මෙම ආයතනය පිහිටුවීමේ අරමුණක් වන බවත්, මෙහි අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු බවත් කාරක සභාව අවධාරණය කරන ලදී.

ප්‍රමාදයන් අවම කිරීම සඳහා අධිකාරියේ හිටපු ප්‍රධාන විධායක නිලධාරී, වෛද්‍ය විජිත් ගුණසේකර මහතා විසින් පනතෙහි 109 වගන්තියට අනුව WOR නිකුත් කිරීම සඳහා විශේෂ ක්‍රියාපටිපාටිය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරයාට යොමු කර ඇති 2022 සැප්තැම්බර් 02 දිනැති ලිපියට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද ප්‍රසම්පාදනය සම්බන්ධ විවිධ අරමුදල් සපයන ආයතන සඳහා WOR නිකුත් කිරීම සඳහා වේගවත් යාන්ත්‍රණයක් අධිකාරිය විසින් සැලසුම් කර ඇති බව සඳහන් වීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය. අදාළ වේගවත් යාන්ත්‍රණය කුමක්ද යන්න තාක්ෂණික කරුණක් නිසා ඒ පිළිබඳව ප්‍රධාන විධායක නිලධාරියා අමාත්‍යාංශය දැනුවත් නොකළ බවත් අනාවරණය විය.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත, අතිරේක ලේකම් වෛද්‍ය රත්නායක මහතාගේ අත්සනින් 2022.09.02 දින තබා ඇති සටහනට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි මාස 6ක් ඇතුළත WOR නිකුත් කිරීම සඳහා වේගවත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට නිර්දේශ කිරීමත්, එදිනම (2022.09.02 දින) ප්‍රධාන විධායක නිලධාරී විසින් WOR නිකුත් කිරීම සඳහා අධිකාරිය විසින් වේගවත් යාන්ත්‍රණයක් අනුගමනය කරන බවට

සඳහන් කිරීමත් පිළිබඳව කාරක සභාවේ විශේෂ අවධානයට යොමු වූ අතර මෙසේ විශේෂ මාර්ගයක් අනුගමනය කිරීමට ලේකම්වරයාට තාක්ෂණික දැනුමක් නොමැති බැවින් අතිරේක ලේකම්, ඖෂධ සැපයීම් හා නියාමන අංශයෙන් උපදෙස් ලබා ගත් බවත්, අතිරේක ලේකම් වෛද්‍ය රත්නායක මහතා මෙම ක්‍රමවේදය සම්බන්ධයෙන් දැනුවත්ව මෙම අවසරය ලබා දුන් බවත්, විශේෂඥ වෛද්‍යවරුන් සිටින කමිටුව හරහා නොගොස් මෙම ක්‍රියාවලිය මාස 6ක් ඇතුළත සිදු කිරීමට අතිරේක ලේකම්වරයා නිර්දේශ ලබා දුන් බවත් කමිටුවේදී වැඩි දුරටත් අනාවරණය විය.

08. Special Pathway ක්‍රමය හරහා ඖෂධ ආනයනය කිරීම

WOR කමිටුවට තම කාර්යභාරය සිදු කර ගත නොහැකි බව කිසියම් අවස්ථාවක දැනුම් දී ඇත්ද යන්න පිළිබඳවත් මෙම අවසන් නොවූ WOR නිකුත් කිරීම (Backlog) සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කළේද යන්න පිළිබඳවත් කාරක සභාව අවධානය යොමු කළ අතර, පනතේ 26 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයාගෙන් විධානයක් ලැබී නොමැති බවද තහවුරු විය. ඖෂධ අවශ්‍යතාව පිළිබඳ තහවුරු කිරීම් සිදු වන්නේ ඖෂධ සමාලෝචන රැස්වීමේදී බවත් එහි ප්‍රධානියා ලෙස හිටපු සෞඛ්‍ය අමාත්‍යතුමා සහභාගී වූ බවත් අනාවරණය විය.

Special Pathway ක්‍රියාවලිය නවත්වන ලෙස තීරණය කළ පසුවද වෛද්‍ය විජිත් ගුණසේකර මහතා විසින් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යොමු කරමින් මෙම ක්‍රියාවලිය දිගටම කරගෙන යන ලෙසට අනුමැතිය ඉල්ලා ඇති බවත් ඒ සඳහා ලේකම්වරයා අනුමැතිය ලබා දී ඇති බවද, අධ්‍යක්ෂ මණ්ඩලය WOR නිකුත් කිරීම අත්හිටුවන ලෙස තීරණය කළ පසුව ද තවත් WOR 60 ක් පමණ නිකුත් කර ඇති බව අනාවරණය වූ අතර ආයතනයේ ප්‍රධානියා වශයෙන් එවක සභාපතිවරයාගේ ක්‍රියාකලාපය හා එවක ප්‍රධාන විධායක නිලධාරියාගේ ක්‍රියාකලාපය පිළිබඳව කාරක සභාව දැඩි අප්‍රසාදය පළ කළාය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ අතුරු තහනම් නියෝගය නිසාවෙන් Savaorite සමාගමෙන් ගෙන්වන ලද අදාළ ඖෂධ තොගය මෙතෙක් රේගුවෙන් නිදහස් කර නොමැති අතර ඒ සඳහා ප්‍රමාද ගාස්තු ගෙවමින් (demurrage) වරාය තුළ රඳවාගෙන ඇති බවත්, Savorite සමාගම විසින් එවක සිටි සෞඛ්‍ය අමාත්‍යවරයාට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත්, Savorite සමාගම ඇතුළත්

කරමින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යවරයා වූ කෙහෙලිය රඹුක්වැල්ල මහතා විසින් වාචික උපදෙස් ලබා දී ඇති බවත් කාරක සභාවේදී අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

ප්‍රධාන විධායක නිලධාරියා විසින් තම නිල විද්‍යුත් ලිපිනය භාවිතා කරමින් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද ලිපිය **<u>සති 02</u>** ක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති- ජාතික ඖෂධ නියාමන අධිකාරිය
ප්‍රධාන විධායක නිලධාරි- ජාතික ඖෂධ නියාමන අධිකාරිය

09. <u>කාරක සභාවේ සභාපතිවරයාගේ පැහැදිලි කිරීම</u>

මෙම විමර්ශන නැවත ප්‍රාණවත් කළ යුතු බවත් ඒ මන්ද යත් පාර්ලිමේන්තුව සතුව ඇති පරමාධිපත්‍ය බලය මත පදනම්ව ආයතන වෙත මහජන මුදල් වෙන් කිරීම සිදුවන බැවින් හා මහජන මුදල්වලින් සිදු කරන කාර්යභාරය හා රටේ ජනතාවගේ සුභසිද්ධිය උදෙසා මෙවැනි නියාමන ආයතන පිහිටුවා ඇති බවත් එකී ආයතනවල පරිපාලනය නිසි පරිදි සිදු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත් කර ඇති බවත් කාරක සභාවේ සභාපතිවරයා ප්‍රකාශ කළේය.

එමෙන්ම, ලංකාව තුළට මිනිස් ජීවිතවලට හිතකර ඖෂධ හා සුවඳ විලවුන් දේශියව නිෂ්පාදනය මෙන්ම ආනයනය කිරීමට අවශ්‍ය නියාමන කාර්යය සිදු කිරිමේ වගකීම මෙම ආයතනයට පැවරෙන බවත්, ඒ සඳහා 2015 අංක 5 දරන ඖෂධ නියාමන අධිකාරි පනත මගින් බලය ලබා දී ඇති බවත් ඔහු තවදුරටත් ප්‍රකාශ කළේය.

මෙහිදී මෙම ආයතනය නියාමන කාර්යභාරය සම්පූර්ණයෙන්ම මඟහැර එක් පුද්ගලයෙකුට බලය පවරා හිතුමතේ ඖෂධ ගෙන්වීමට කටයුතු කර ඇති බවත් කාරක සභාවේ අවධානයට යොමු වූ අතර ඖෂධ නියාමනය පිළිබඳ තම වගකීම පැහැර හැර ඇති බව ඔහු අවධාරණය කළේය. ඉල්ලීම් ලිපිය, WOR අයදුම්පත, මිලදීගැනුම් ඇණවුම (Purchase order), ඉන්ඩෙන්ටුව වැනි ප්‍රාථමික ලිපි ලේඛන පමණක් පරීක්ෂා කර,

ඖෂධවල ගුණත්වය, ප්‍රත්‍යක්ෂභාවය හා ආරක්ෂාව යන මූලික කරුණු සම්බන්ධයෙන් වන කිසිදු පිරිවිතරයක් පරීක්ෂා කිරීමකින් තොරව මෙලෙස, WOR කමිටුවේ අනුමැතියකින් තොරව Special pathway ක්‍රමවේදය හරහා ඖෂධ ආනයනය කිරීමට ඉඩ දීම සම්බන්ධයෙන් කාරක සභාවේ දැඩි අප්‍රසාදය පළ කළාය.

මෙම සම්පූර්ණ ක්‍රියාවලිය තුළ ආයතනයේ හිටපු සභාපතිවරයා වගකීම් විරහිතව කටයුතු කර ඇති බවත් විගණන වාර්තා මගින් පෙන්වා දෙන ලද WOR නිකුත් කිරීමේ දී සිදු වී ඇති අක්‍රමිකතා හඳුනා ගැනීමට අපොහොසත්වීම හා කිසිදු විනිවිදභාවයක් නොමැති ක්‍රියාවලියට ඉඩ දී තත්ත්වයෙන් අසමත් ඖෂධ හා උපකරණ ආනයනය කර ඇති බවත් ඒ සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ලද රු. බි. 70 ක පමණ මුදලක් වැය කරමින් 2022 වසරේ WOR ලිපි 224 ක්, 2023 වසරේ ලිපි 135 ක් නිකුත් කර විශාල මූල්‍යමය මෙන්ම සමාජ, සෞඛ්‍යමය හානියක් සිදුකිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ද වගකීම් පැහැරහැර ඇති බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට මෙම කටයුතු නියාමනය කිරීමේ වගකීමක් තිබූ බවත් කාරක සභාව අවධාරණය කළාය.

එමෙන්ම මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් කිසිදු අය කිරීමකින් තොරව WOR නිකුත් කරන ලෙස දන්වා ඇති නමුත් මෙහි දී මුදල් අයකර මූල්‍යමය වංචාවක් ද සිදුවී ඇති බව පෙනී යන බවත් මෙවැනි ක්‍රියාවලි නැවත සිදු නොවීමට ආයතනය වගබලා ගතයුතු බව කාරක සභාව අවධාරණය කළාය.

මෙම ඖෂධ තොග අවශ්‍යතාවය පිළිබඳව නිශ්චය කර ගන්නා මෙන් භාණ්ඩාගාර නියෝජිත, වෛද්‍ය ප්‍රදීප් කුමාරසිංහ ද සිල්වා හා වෛද්‍ය කෝසල කරුණාරත්න යන අය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ප්‍රකාශ කළ බව අදාළ රැස්වීම් කාර්ය සටහන්වල අඩංගු වන බව හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වශයෙන් ඔවුන් වගකීම් සහගතව කටයුතු කළ බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

මෙම ආයතනය තුළ යහපාලන මූලධර්මවල ගැටලුවක් පවතින බවත් ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කිරීම ගැටලු සහගත බවත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව එම නිවැරදි කිරීම් සිදු විය යුතු බවත් විගණකාධිපතිවරයා අවධාරණය කරන ලදි.

Annex 1)

දුරකථන / தொலைபேசி / Telephone: 011 2669192, 011 2675011, 011 2698507, 011 2694033, 011 2675449, 011 2675280
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2693866, 011 2693869, 011 2692913
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: postmaster@health.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.health.gov.lk

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
MINISTRY OF HEALTH

අමාත්‍ය මණ්ඩල සංදේශය

ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩ වෛද්‍ය සැපයීම් සේවාවක් පවත්වා ගෙන යාම

1.0 පසුබිම

1.1 ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආයතන වෙත ඖෂධ සහ පාරිභෝජන භාණ්ඩ ප්‍රසම්පාදනය, බෙදා හැරීම හා නියාමනය සහ ඒවායේ ගුණාත්මකභාවය සහ රෝගීන් දක්වා සැපයීම අධීක්ෂණය කිරීම පිළිබඳ පූර්ණ වගකීම, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඊට අයත් ආයතන වන වෛද්‍ය සැපයුම් අංශය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතු වේ.

1.2 ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආයතන සඳහා අවශ්‍ය ඖෂධ, ශල්‍ය වෛද්‍ය උපකරණ, රසායනාගාර උපකරණ, විකිරණශීලී උපකරණ සහ පාරිභෝජන භාණ්ඩ (වෛද්‍ය සැපයුම්) සැපයීම සඳහා ශ්‍රී ලංකා රජය වාර්ෂිකව රුපියල් බිලියන 65 ක් පමණ වැය කරනු ලබයි. පවත්නා විදේශ විනිමය අර්බුදය, රට තුළ ඖෂධ හිඟයක් නිර්මාණය කරමින් වෛද්‍ය සැපයුම් දාමයට අහිතකර ලෙස බලපා ඇත.

1.3 මෙම අරමුණ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය, ආසියානු සංවර්ධන බැංකු අරමුදල්, ලෝක බැංකු අරමුදල් සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු අරමුදල් භාවිත කොට ඇති අතර අවශ්‍ය වෛද්‍ය සැපයීම් ලබා ගැනීම පිණිස බහු ණය යෝජනා ක්‍රම සහ පරිත්‍යාගශීලී ආයතන සම්බන්ධීකරණය කිරීමට ගත හැකි සෑම ප්‍රයත්නයක් මෙන්ම අවශ්‍ය ක්‍රියාමාර්ග අමාත්‍යාංශය විසින් ගෙන ඇත.

2.0 විස්තරය හා සාධාරණීකරණය

2.1 වෛද්‍ය සැපයීම් සඳහා රජයේ ප්‍රධානම ප්‍රසම්පාදන නියෝජිත ආයතනය වන්නේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවයි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වෛද්‍ය සැපයුම් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ පරිපාලන ක්‍රියාවලිය හේතුවෙන් වෛද්‍ය සැපයීම් ආනයනය සඳහා සැලකිය යුතු කාල සීමාවක් ගතවනු ඇත.

385, සුවසිරිපාය, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව. 385, சுவசிரிபாய, வணக்கத்துக்குரிய பத்தேகம விமலவன்ச தேரோ மாவத்தை, கொழும்பு 10, இலங்கை
385, Suwasiripaya, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka

2.2 වෛද්‍ය සැපයුම් අංශය තුළ වෛද්‍ය සැපයුම් වල දැනට පවතින තොග අවදානම් මට්ටමක පවතී. මේ අවස්ථාව වන විට (2022 ඔක්තෝබර් මස 17 වන විට) වෛද්‍ය සැපයුම් අංශයේ ඖෂධ 151 ක, ශල්‍ය වෛද්‍ය උපකරණ සහ පාරිභෝජන භාණ්ඩ 5278 ක, විකිරණශීලී උපකරණ 18 ක සහ නිත්‍ය සහ අනුපූරක රසායනාගාර උපකරණ 850 ක තොග ශූන්‍ය මට්ටමක පවතී. ඉදිරි සති 3ක කාල සීමාව තුළ තවත් බොහෝ උපකරණ වල තොග අවසන් වනු ඇති බවට අපේක්ෂා කෙරේ.

2.3 තවත් ඖෂධ 21 ක සහ ශල්‍ය වෛද්‍ය උපකරණ සහ පාරිභෝජන භාණ්ඩ 2002 ක රෝහල් (ආයතනික) තොග මට්ටම් දැනටමත් ශූන්‍යව පවතී. මෙම හේතුව නිසා ඉදිරි සති තුනක කාල සීමාව තුළ රටේ සෞඛ්‍ය ආයතන තුළ උග්‍ර වෛද්‍ය සැපයුම් හිඟයක් නිර්මාණය වීමේ දැඩි අවධානමක් පවතී. (හිඟ අයිතම පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇමුණුම 1 වශයෙන් මීට යා කොට ඇත)

2.4 මැහුම් අමුද්‍රව්‍ය සහ නිර්වින්දන ඖෂධ වැනි අත්‍යාවශ්‍ය ශල්‍ය වෛද්‍ය උපකරණ වල තොග මට්ටම් අවසන් වීම සහ ඉතා අවම මට්ටමක පැවතීම, ඉදිරි සති තුනක කාල සීමාව තුළ ශෛල්‍යාගාර වල ක්‍රියාකාරීත්වය මුළුමනින්ම අක්‍රිය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. (ඇමුණුම 2)

2.5 වත්මන් විදේශ විනිමය අර්බුදය තුළ අත්‍යාවශ්‍ය වෛද්‍ය සැපයුම් මිළ දී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශය විසින් ප්‍රධානතම අරමුදල් සලසා ගැනීමේ ක්‍රමය වශයෙන් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය භාවිත කර ඇත. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත වෙන් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 114.9 ක මුදලින් මේ වන විට ඇමරිකානු ඩොලර් මිලියන 68.5 ක මුදලක් පමණක් එකී සංස්ථාව විසින් භාවිත කොට ඇත. (2022 සැප්තැම්බර් 14 වන විට වෛද්‍ය සැපයීම් සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය භාවිත කිරීම පිළිබඳ සම්පූර්ණ විස්තරයක් මීට ඇමුණුම 3 වශයෙන් යා කොට ඇත.)

2.6 ඉන්දියානු ණය යෝජනා ක්‍රමය සහ අනෙකුත් අරමුදල් ක්‍රම භාවිත කර දින 45 ක් ඇතුළත ශ්‍රී ලංකාව වෙත මාස 03 ක කාලයක් සඳහා ප්‍රමාණවත් වන වෛද්‍ය සැපයීම් තොග ලබා දීම සඳහා The Savorite Pharmaceuticals (Pvt) Ltd (703, Atlantis Heights, Sarabhai Compound, Vadiwadi Road, Vadodara- 39007 Gujarat, India.) ආයතනය විසින් එකඟතාව පළ කොට ඇත. (ඇමුණුම 4)

2.7 වත්මන් විදේශ විනිමය අර්බුදය තුළ අවශ්‍ය වෛද්‍ය සැපයුම් මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මූලික අරමුදල් මාර්ගය ලෙස ඉන්දියානු ණය යෝජනා ක්‍රමය භාවිතා කර ඇත.ඒ යටතේ මුදල් අමාත්‍යාංශයේ ඉන්දීය ණය පහසුකම් සම්බන්ධීකරණ අංශය (ICFC) සහ ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයෙහි පවත්නා පරිපාලමය හා අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලිය සඳහා මේ වනවිට ලිපිගොනු දහසකට වඩා වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇති අතර අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත වන බව නිරීක්ෂණය වේ. එබැවින් සෞඛ්‍ය අංශ සඳහා අත්‍යවශ්‍ය ඖෂධ, ශල්‍ය පරිභෝජ්‍ය ද්‍රව්‍ය (Surgical items) හා ප්‍රතික්‍රියාකාරක (reagents) කඩිනමින් සපයා ගැනීමේ බරපතල ගැටළුවක් උද්ගත වී ඇති බව ද නිරීක්ෂණය වී ඇත.

3.0 යෝජිත විසඳුම

3.1 වෛද්‍ය සැපයුම් අංශයේ හදිසි තත්වය සහ දැඩි අවශ්‍යතාව මත පදනම්ව, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ පවතින ඉතිරි අරමුදල් සහ වෙනත් අරමුදල් ක්‍රම භාවිත කරමින් මාස 3 ක කාලසීමාවක් සඳහා ප්‍රමාණවත් වෛද්‍ය සැපයුම් ආනයනය කිරීම සඳහා The Savorite Pharmaceuticals (Pvt) Ltd වැනි තෝරාගත් පෞද්ගලික අංශයේ ඖෂධ ආනයනය කරනු ලබන හෝ නිපදවනු ලබන ආයතන වෙත අවසර ලබාදීම.

3.2 ඉන්දියානු ණය යෝජනා ක්‍රමය සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් ඇතුළු වෙනත් අරමුදල් ක්‍රම භාවිත කර තෝරාගත් සැපයුම් කරුවන් හා එකඟවී ඇති කාලසීමාවක් තුළ ආනයනය කරන ලද තොග සඳහා වන පිරිවැය සඳහා වන ගෙවීම් සිදු කිරීම.

3.3 මෙම අර්බුදකාරී කාලසීමව තුළ සිදුවන ප්‍රමාදයන් අවමකර ගැනීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ලියාපදිංචිය නොමැති අයිතම ආනයනය කිරීමට ප්‍රථම එකී සංස්ථාවේ නිසි ලියාපදිංචි ක්‍රියාවලියකට භාජනය විය යුතුය.

4.0 අපේක්ෂිත අනුමැතිය

4.1 රජයේ සෞඛ්‍ය ආයතනවල උග්‍ර වෛද්‍ය සැපයීම හිඟයන් ඇතිවීම වලක්වා ගැනීම සඳහා අඛණ්ඩ වෛද්‍ය සැපයුම් සේවාවක් පවත්වා ගැනීම පිණිස, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පහත සඳහන් යෝජනා සඳහා අනුමැතිය අපේක්ෂා කෙරේ.

(*) 4.1.1 වෛද්‍ය සැපයුම් අංශයේ හදිසි තත්ත්වය සහ අවශ්‍යතාවය මත පදනම්ව, ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ ඉතිරිව පවතින අරමුදල් සහ වෙනත් අරමුදල් ක්‍රම භාවිත කරමින් මාස තුනක කාලයක් සඳහා ප්‍රමාණවත් ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාවේ අනුමත වෛද්‍ය සැපයුම් ආනයනය කිරීම සඳහා The Savorite Pharmaceuticals (Pvt) Ltd ආයතනයට සහ වෙනත් තෝරාගත් සැපයුම් කරුවන් වෙත අවසර ලබා දීම සඳහා.

4.1.2 ඉන්දියානු ණය යෝජනා ක්‍රමය සහ වෙනත් අරමුදල් ක්‍රම භාවිත කරමින්, එකඟවනු ලබන ගෙවීම් සැලැස්මකට අනුව ගෙවීම් සිදුකිරීම සඳහා The Savorite Pharmaceuticals (Pvt) Ltd ආයතනය සහ වෙනත් තෝරාගත් සැපයුම් කරුවන් සමග ගිවිසුමක් අත්සන් තැබීම පිණිස අවසර ලබාදීම සඳහා.

අ/කළේ:-
ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල
සෞඛ්‍ය අමාත්‍ය
ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල
සෞඛ්‍ය අමාත්‍ය
2022 ඔක්තෝබර් 25 වන දින දිය.